**විසර්ජන ශීර්ෂය - 266**

**දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - වවුනියා**

**වවුනියා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ඒ යටතේ වන ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල ගිණුම් පිළිබඳ විගණකාධිපති වාර්තාව - 2010**

**1. දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රධාන කාර්යයන්**

(i) රජයේ කටයුතු හා නීතියෙන් පැවරුණු කාර්යයන්හි කාර්ය සාධනය නිලධාරීන් හා සංවිධාන මගින් ගම් මට්ටමින් හා ප්‍රාදේශීය මට්ටමින් සම්බන්ධීකරණය

(ii) අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වල නියෝජිතයා ලෙස කටයුතු කිරීම.

(iii) ආදායම රැස්කිරීම

(iv) මැතිවරණ සම්බන්ධීකරණය

(v) විමධ්‍යගත අයවැය වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම

(vi) පළාත් සභාවේ කටයුතු වලට සහයවීම.

**2. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ වන ප්‍රාදේශීය ලේකම් කාර්යාල**

(අ) වවුනියා උතුර

(ආ) වෙන්ගල වෙඩ්ඩිකුලම්

(ඇ) වවුනියා

(ඈ) වවුනියා දකුණ සිංහල

**3. වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ගිණුම් වර්ෂය ආරම්භයේදී වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

**4. ගිණුම්**

**4.1 මුළු ප්‍රතිපාදනය හා වියදම**

වවුනියා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ඒ යටතේ වන ප්‍රාදේශීය ලේකම් කාර්යාල 4 ක් සඳහා සලසා තිබුණු මුළු ප්‍රතිපාදනය රු.139,800,000 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.137,729,813 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ශුද්ධ ඉතිරි කිරීම් රු.2,070,187 ක් හෝ 1.48% ක් විය. විස්තර පහත දැක්වේ.

| වියදම | ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | ඉතිරිය මුළු ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. |
| පුනරාවර්තන | 96,750,000 | 96,750,000 | 94,891,705 | 1,858,295 | 1.92 |
| මූලධන | 43,050,000 | 43,050,000 | 42,838,108 | 211,892 | 0.49 |
| එකතුව | 139,800,000 | 139,800,000 | 137,729,813 | 2,070,187 | 1.48 |

## 4.2 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබාදුන් ප්‍රතිපාදන උපයෝජනය

විවිධ කාර්යයන් සඳහා වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් පහත සඳහන් පරිදි එකතුව රු.166,424,325 ක් වූ ප්‍රතිපාදන ලබාදී තිබුණු අතර එම ප්‍රතිපාදන උපයෝජනය පිළිබඳ විස්තර පහත දැක්වේ.

| ශීර්ෂ අංකය | ප්‍රතිපාදන ලබාදුන් අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව | ප්‍රතිපාදනය | තථ්‍ය වියදම | ඉතිරිය / අතිරික්තය (දෙසැම්බර් 31 දිනට) |
|---|---|---|---|---|
| | | රු.000 | රු.000 | රු.000 |
| 101 | ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය | 250,000 | 250,000 | - |
| 105 | ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය | 8,536,596 | 8,535,986 | 610 |
| 110 | අධිකරණ අමාත්‍යාංශය | 68,400 | 31,160 | 37,240 |
| 118 | කෘෂිකර්ම අමාත්‍යාංශය | 70,000 | 53,464 | 16,536 |
| 120 | ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යාංශය | 4,352,995 | 4,309,338 | 43,657 |
| 121 | රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය | 10,768,610 | 10,742,205 | 26,405 |
| 124 | සමාජ සේවා අමාත්‍යාංශය | 4,822,915 | 4,130,209 | 692,708 |
| 127 | කම්කරු සබඳතා හා ඵලදායිතා ප්‍රවර්ධන අමාත්‍යාංශය | 33,000 | 30,061 | 2,939 |
| 133 | තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය | 236,430 | 223,782 | 12,648 |
| 145 | නැවත පදිංචි කිරීමේ අමාත්‍යාංශය | 25,701,956 | 25,645,099 | 56,857 |
| 153 | ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය | 909,500 | 827,196 | 82,304 |
| 201 | බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව | 2,507,465 | 2,474,770 | 33,695 |

| | | | | |
|---|---|---|---|---|
| 206 | සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව | 4,150 | 4,150 | - |
| 210 | ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව | 38,000 | 36,650 | 1,350 |
| 216 | සමාජ සේවා දෙපාර්තමේන්තුව | 294,080 | 276,007 | 18,073 |
| 217 | පරිවාස හා ළමා රක්ෂක සේවා දෙපාර්තමේන්තුව | 585,300 | 583,125 | 2,175 |
| 218 | සමෘද්ධි කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව | 52,686,415 | 47,230,315 | 5,456,100 |
| 226 | ආගමන හා විගමන දෙපාර්තමේන්තුව | 1,500,000 | 1,500,000 | - |
| 252 | ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව | 819,430 | 527,637 | 291,793 |
| 253 | විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව | 51,895,083 | 51,462,381 | 432,702 |
| 254 | රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව | 24,500 | 20,047 | 4,453 |
| 307 | මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව | 319,500 | 281,568 | 37,932 |
| | එකතුව | 166,424,325 | 159,175,150 | 7,249,175 |

## 4.3 විගණනය හා විගණන විෂය පථය

වවුනියා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා , සැසඳුම් ප්‍රකාශන , පොත්පත් , ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදි. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2011 අගෝස්තු 16 දින දිස්ත්‍රික් ලේකම්වරයා වෙත නිකුත් කරන ලදි. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ , අදහස් දැක්වීම් සහ සොයා ගැනීම් , විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනු වල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය සහ පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 4.4 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශ සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරියාගේ වගකීම

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්හි විධිවිධානයන්ට සහ රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසි වලට අනුකූලව පවත්වා ගෙනයාම , පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ගණන්දීමේ නිලධාරියාගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශ පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම , ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 4.5 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශ පිළිබඳ විගණන නිරීක්ෂණය

2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව වවුනියා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන මෙම වාර්තාවේ (අ) සිට ( ඇ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ 4.6 සිට 4.9 දක්වා වූ ඡේද වල ඇතුළත් ප්‍රධාන විගණන නිරීක්ෂණ හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය වේ.

**(අ) ගිණුම් ඉදිරිපත් කිරීම**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් 2011 මාර්තු 31 දින වන විට පහත සඳහන් ගිණුම් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

| ශීර්ෂය / විෂය අංකය | ගිණුමේ නම |
|---|---|
| 266 | විසර්ජන ගිණුම |
| 26601 | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම |

**(ආ) අග්‍රිම ගිණුම**

2010 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ගිණුමේ වාර්තා කරන ලද නිරවුල් නොකළ උප අග්‍රිම රු.28,113 ක් වූ අතර එම උප අග්‍රිම වර්ෂය තුළ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

**(ඇ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

(i). 2010 දෙසැම්බර් 31 දිනට වූ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශයට අනුව, 2010 දෙසැම්බර් 31 දිනට හිඟ හිට පැවතුණු ශේෂ එකතුව රු.1,094,102 ක් වූ අතර එම හිඟ ශේෂයන් අයකර ගැනීම පිළිබඳ පසු විපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

(ii). භාණ්ඩාගාර පොත් අනුව 2010 දෙසැම්බර් 31 දිනට හිඟ හිට පැවති ශේෂය රු.32,492,871 ක් වූ අතර වවුනියා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පොත් වලට අනුව එම ශේෂය රු.32,458,071 ක් වුයෙන් රු.34,800 ක නොසැසඳු වෙනසක් දැක්වුණි.

## 4.6 වත්කම් කළමනාකරණය

### (අ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම

මුදල් රෙගුලාසි 756 හා 2009 දෙසැම්බර් 09 දිනැති අංක 441 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ඒ යටතේ වන ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්විය යුතු වුවත් වවුනියා ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2010 වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණ පවත්වා නොතිබුණි.

### (ආ) බේරුම් නොකළ බැරකම්

2010 දෙසැම්බර් 31 දිනට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පැවති බේරුම් නොකළ බැරකම් රු.274,378 ක් වූ අතර මෙම බැරකම් වර්ෂ 1 කට අඩු කාලයක් බේරුම් නොකර පැවතුණි.

## 4.7 අනුකූල නොවීම්

### (අ) නීති , රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම

විගණන නියැදි පරීක්ෂණ වලදී නිරීක්ෂණය වූ නීති , රීති , හා රෙගුලාසි වල විධිවිධානයන්ට අනුකූල නොවීම් අවස්ථා විග්‍රහ කර පහත දැක්වේ.

| නීති , රීති හා රෙගුලාසි වලට යොමුව | වටිනාකම<br>රු. | අනුකූල නොවීම |
|---|---|---|
| <u>චක්‍රලේඛ විධිවිධාන</u> | | |
| (i) **භාණ්ඩාගාර චක්‍රලේඛ** | | |
| (අ) 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/02/02 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | - | පරිගණක , උපාංග හා මෘදුකාංග සඳහා ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| (ආ) 2006 මාර්තු 24 දිනැති අංක 28 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | වටිනාකම දැක්විය නොහැක. | 2010 වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| 2002 නොවැම්බර් 28 දිනැති අංක 438 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | - | වෙන්ගලචෙඩ්ඩිකුලම් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ අළුත් වැඩියා කළ නොහැකි විෂයයන් 6 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |
| 2004 පෙබරවාරි 24 දිනැති අංක 01/2004 දරන ජාතික අයවැය චක්‍රලේඛය | - | 2010 වර්ෂය සඳහා කාර්ය සාධන වාර්තා නියමිත දිනට ඉදිරිපත් කර නොතිබුණි. |
| (ii) **රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ** | | |
| 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 | 1,308,448 | වාහන 17 ක් අළුත් වැඩියා කිරීම සඳහා පිළිගත් කාර්මික ඉංජිනේරුවරයකුගේ සහතිකයක් ලබාගැනීමෙන් තොරව රු.1,308,448 ක මුදලක් ගෙවා තිබුණි. |

## 4.8 බැංකු ගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු

**ගැලපුම් කළ යුතු ශේෂ**

2010 දෙසැම්බර් මාසය සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 4 ක් විසින් පිළියෙල කර තිබුණු බැංකු සැසඳුම් ප්‍රකාශ වල දැක්වුණු ගැලපුම් පිළිබඳ විග්‍රහයකදී අනාවරණය වූ තොරතුරු අනුව නිකුත් කරන ලද රු.468,045 ක් වටිනා චෙක්පත් 29 ක් මාස 6 කට වැඩි කාලයක් ගෙවීම සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

## 4.9 මානව සම්පත් කළමනාකරණය

**අනුමත සේවක සංඛ්‍යාව හා පුරප්පාඩු**

2010 දෙසැම්බර් 31 දිනට සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි වේ.

| | තනතුරු වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i). | ජ්‍යෙෂ්ඨ මට්ටම | 06 | 05 | 01 |
| (ii). | ද්විතීයික මට්ටම | 34 | 28 | 06 |
| (iii). | ප්‍රාථමික මට්ටම | 10 | 09 | 01 |
| (iv). | වෙනත් | 04 | 04 | - |
| | එකතුව | 54 | 46 | 08 |